(c) www.sinhalalyrics.com

තරුද නිදන මහරෑ
නිදම් මහද නිදි නෑ
මතක පොතේ කඳුලින් කටුගෑ
කව් කියවෙයි මහරෑ

පිණි විසිරෙන විට වටහා ගනු මැන
දෙනෙතින් කඳුළැලි ගලන තරම්
රෑහි හඬන විට හඳුනා ගනු මැන
රෑ තුන්යාමේ හඬන හැඬුම්

සුළඟ නොවේ මේ පාවී එන්නේ
කුටියක සිරවී හෙලන සුසුම්
අතු අග පරවී බිමට වැටෙන්නේ
සමනළ යුගයක පිපුණු කුසුම්

පද රචනය - සුනිල් ආරියරත්න
සංගීතය - රෝහණ වීරසිංහ